ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No

ඔබේ අංකය / உமது இல. / Your No

දිනය / திகதி / Date: 2024.01.18

පැමිණිලි පාර්ශවය : ඩී.එම්.ඩබ්ලිව් කුමාරිහාමි මිය,
අංක 603/3, මාර්ටින් වික්‍රමසිංහ මාවත,
මයිලගස් හන්දිය,
අනුරාධපුර.

වගඋත්තර පාර්ශවය : ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත,
අනුරාධපුරය.

**පැමිණිලි අංකය : HRC/AP/114/2019(1)**

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින්, ප්‍රකාශ කර ඇත්තේ, තමා උතුරුමැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමණාකරණ සහකාරවරිය ලෙස සේවය කරන බවයි. 2018.03.25 වන දින පැවැත්වූ කළමණාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියට කුසලතා මත උසස් කිරීමේ තරඟ විභාගයට පෙනී සිට 4 වන ස්ථානයට තමා තේරී පත් වූ බවත්, ඒ අනුව 2019.02.26 දින සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටින ලද බවත් දක්වා ඇත.

නමුත් තමා සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් පැවතීම හේතුවෙන් තමාගේ නම, නාම ලේඛනයෙන් ඉවත් කොට අනෙකුත් නිලධාරින් හට පත්වීම් ලබාදීම සඳහා නාම ලේඛනයක් සකස් කර අනුමැතිය සඳහා උතුරුමැද පළාත් ආණ්ඩුකාර වෙත යොමු කර ඇති බවත්, තමා හට උසස්වීම ලබානොදීමට කටයුතු කරමින් පවතින බවත් දක්වා ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්.ඒ.ද මෙල් මාවත, කොළඹ-04. / இல.14, ஆர்.ஏ.டி.மெல் மாவத்தை, கொழும்பு-04. / No.14, R.A. De Mel Mawatha, Colombo-04.
සභාපති / தவிசாளர் / Chaiman: 011-2505551
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / Email: sechrcsl@gmail.con
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hresl.lk

ඉහත අධිකරණයේ පැවැති නඩුව සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් පැමිණිලි පාර්ශවය සඳහන් කර ඇත්තේ, තමා පදිංචිව සිටින පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවට අයත් ඉඩමින් තමාව ඉවත් කිරීම සඳහා පළාත් ඉංජිනේරු විසින් අධිකරණයේ නඩු පවරන ලද බවත්, ඊට අදාළ පිසිකල් නියෝගය ලද පසුව ඔහු වෙත 2018.07.23 දින අදාළ දේපළ භාරදීමට කටයුතු කරන ලද බවත්ය. අදාළ නිල නිවස සම්බන්ධ නඩු විභාගය අවසානයේ පැමිණිලිකාරියව වැරදිකරුවෙකු කර නොමැති බවත්, පැමිණිලිකාරිය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහ විධිවිධාන ප්‍රකාරව හෝ පළාත් රාජ්‍ය සේවා විනය කාර්යය සංග්‍රහය ප්‍රකාරව කිසිඳු විනය පරීක්ෂණයක් පවත්වා නොමැති බවත්, තම පුද්ගලික ලිපි ගොනුව අනුව සනාථ වන බවත් දක්වා ඇත.

තමා කිසිදු අධිකරණයකින් වරදකරුවෙකුව නොතිබියදී හා දෙපාර්තමේතුව විසින් තමාට එරෙහි කිසිඳු විනය නියෝගයක් ලබා දී නොතිබියදී තරඟ විභාගයකට ඉදිරිපත්ව ඉන් සමත් වී සම්මුඛ පරීක්ෂණයේදී 'තමාට ඒරෙහිව ගරු අධිකරණයේ නඩුවක් පැවතියේය' යන පදනම මත තම අභ්‍යන්තර උසස් වීම ලබා දීම ප්‍රතික්ෂේප කිරීම තුළින් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවද දක්වා ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

පැමිණිල්ලට අදාළව 2019.04.11 දිනැති හා අංක NCP/PSC/1/13/04 -12 දරණ ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් ඉදිරිපත් කර ඇති වාර්තාවට අනුව දක්වා ඇත්තේ, කළමණාකරණ සේවයේ අධිශ්‍රේණිය සඳහා බඳවා ගැනීමට අදාළ විභාගය සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලුම්පත් කැඳවන ලද බවත්, ඒ අනුව මෙම පැමිණිලිකාරිය විභාගයට පෙනී සිට ඇති අතර, පැමිණිලිකාරිය විභාගය සමත්ව ඇති බවත්, ඒ අනුව කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව එම නිලධාරිනියගේ පෞද්ගලික ලිපි ගොනු ගෙන්වා ආණ්ඩුකාරතුමාගේ අනුමැතියෙන් පත් කරන ලද ලකුණු ලබා දීමේ කමිටුවක් මඟින් පෞද්ගලික ලිපි ගොනුවේ තිබූ ලියවිලි අනුව පළපුරුද්ද හා ජ්‍යෙෂ්ඨත්වය සඳහා ලකුණු ලබා දෙන බවත්, ඒහිදි පැමිණිලිකාරිය කළමනාකරණ සහකාර සෙවයේ අධිශ්‍රේණියට සුදුසුකම් සපුරා ඇති බවත්ය.

නමුත් මෙම පැමිණිලිකාරිය සම්බන්ධයෙන් නඩුවක් විභාග වෙමින් පවතින බවට නිර්නාමික පෙත්සමකින් වාර්තා වූ බැවින් තම කොමිෂන් සභාව විසින් පැමිණිලිකාරිය සම්බන්ධයෙන් විනය පරීක්ෂණ හෝ අධිකරණයේ පවතින නඩු පිළිබඳ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙතින් තොරතුරු කැඳවූ බවත්, එහිදී පැමිණිලිකාරිය අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 44/388 යටතේ විභාග වී ඇති නිල නිවාස සන්තකය ආපසු භාර නොදීම සම්බන්ධව නඩුවේ විභාගය අවසානයේදී පැමිණිලිකාරිය වරදකරු වූ බවට තීන්දුව ලබා දී ඇති බවට කරුණු ඉදිරිපත්වී ඇති බවත් සඳහන් කර ඇත.

ඒ අනුව, සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණිලිකාරිය ඉදිරිපත් වූ 2017.12.31 දිනට පූර්වාසන්න වසර 05 ක් තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ වී නොතිබූ අතර, විනය දඬුවමකට පැමිණිලිකාරිය භාජනය වී නොමැති බවට පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරයා විසින් ලබා දී ඇති වාර්තාව සාවද්‍ය බව සනාථ වූ බවත් සඳහන් කරයි.

එමෙන්ම, පැමිණිලිකාරිය රජයේ දේපළ අයථා ලෙස සන්තකයේ තබා ගෙන ආයතන සංග්‍රහයේ ii වන කාණ්ඩයේ පළමු වන උපලේඛනයේ 8,9,10,14,15,16 යන වගන්ති යටතේ සඳහන් වැරදි සිදු කර ඇති බව පෙනී යන හෙයින් හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 186 ii අනුව උසස්වීමක් සඳහා නිර්දේශ කර නොමැති බවද දක්වයි.

ඉහත කරුණු අනුව, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පැමිණිලිකාර නිලධාරිනියගේ සහකාර සේවයේ අධිශ්‍රේණියට උසස්වීම ලබා දීම අත්හිටවූ බවද සඳහන් කර ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකාරිය තම පැමිණිල්ල මඟින් ප්‍රකාශ කර ඇත්තේ, කළමණාකරණ සේවයේ අධිශ්‍රේණිය සඳහා වන තරඟ විභාගයට පෙනී සිට සමත් වුවත්, එම විභාගය අනුව පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී, නිල නිවසක් සම්බන්ධයෙන් තමාට එරෙහිව අධිකරණයේ නඩුවක් පැවත ඇති බවට කරුණු දක්වා තම උසස්වීම ප්‍රතික්ෂේප කර ඇති බවයි.

වගඋත්තර පාර්ශවය විසින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, මෙම පැමිණිලිකාරිය පදිංචි නිල නිවස, නිවාස සන්තකය ආපසු භාර නොදීමට එරෙහිව අනුරාධපුර ම/අධිකරණයේ අංක 44385 දරණ නඩුව අවසානයේ පැමිණිලිකාරිය වරදකරු වූ බවට තීන්දුවක් ඉදිරිපත්ව ඇති බවත්, ඒ අනුව පැමිණිලිකාරිය 2017.12.31 දිනට පූර්වාසන්න වසර 05 ක් තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා විනය දඬුවමකට පැමිණිලිකාරිය ලක්ව නොමැති බවට පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක විසින් එවා ඇති වාර්තාව සාවද්‍ය වාර්තාවක් බවත්, මෙම කරුණු පදනම්ව පැමිණිලිකාරියගේ උසස්වීම ලබා දී නොමැති බවත්ය.

පැමිණිලිකාරිය රජයට අයත් නිල නිවසක පදිංචිය දැරීම හේතු කොට ගෙන පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් පැමිණිලිකාරියට එරෙහිව නඩු අංක 44385 යටතේ මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ නඩුවක් පවරා ඇති බවටත්, එම නඩුව මඟින් මෙම පැමිණිලිකාරිය රජයේ නිල නිවසින් නෙරපා හැරීමේ රිට් ආඥාවක් නිකුත් කර ඇති බවටත් කරුණු නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරිය රාජ්‍ය කළමණාකරණ සහකාර සේවයේ අධිශ්‍රේණියට උසස්වීමක් ලබා ගැනීම සඳහා 2018.03.25 දින තරඟ විභාගයට පෙනී සිටිමින් විභාගය සමත්ව 2019.02.26 වන දින සම්මුඛ පරීක්ෂණයක් සඳහාද පෙනී සිට ඇත.

පැමිණිලිකාරිය අදාළ උසස්වීම ලබා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පැමිණිලිකාරියට එරෙහිව රජයේ නිල නිවසක් සම්බන්ධයෙන් අංක 44385 යටතේ අධිකරණයේ නඩුවක් විභාග කර එම නඩුව අවසානයේ පැමිණිලිකාරිය වරදකරු කර ඇති බැවින් පැමිණිලිකාරිය උසස්වීම ඉල්ලා සිටින 2017.12.31 දිනට පූර්වාසන්න වසර 05 ක් සතුටුදායක සේවා කාලයක් නොමැති සේ සලකා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය කටයුතු කර ඇති බවත්, ඒ අනුව, පැමිණිලිකාරියට උසස්වීම ලබා දී නොමැති බවත්, 2022.08.26 වන දින කොමිෂන් සභාවේ පැවැති පරීක්ෂණයේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහකාර ලේකම්වරිය විසින් ප්‍රකාශ කර ඇත.

එමෙන්ම, පැමිණිලිකාරිය ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ I උපලේඛනයේ 8,9,10,14,15,16යන වගන්ති මඟින් කියවෙන වැරදි සිදු කර ඇති බවටත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීති 186/2 පරිදි උසස්වීමක් ලබා දීම සඳහා නිර්දේශ නොකළ හැකි බවත් සඳහන් කර ඇත.

| | |
|---|---|
| ආ.සං. ii කාණ්ඩය පළමු වන උ/ලේ (8) - | රජයේ සම්පත් සාවද්‍ය ලෙස හෝ අයථා ලෙස හෝ පරිහරණය කිරීම හෝ එසේ කිරීමට ඉඩහැරීම හෝ අවධානයෙන් හෝ අනවධානයෙන් හෝ ඒවා විනාශ වීමට හෝ වටිනාකම් අඩුවීමට හෝ ඉඩහැරීම, |
| ආ.සං. ii කාණ්ඩය පළමු වන උ/ලේ (9) - | නොසැලකිල්ලෙන් හෝ අනවධානයෙන් හෝ හිතාමතා හෝ රජයේ අයිතිවාසිකම් වලට හානි වන අයුරින් ක්‍රියාකිරීම හෝ එසේ කිරීමට ඉඩහැරීම. |
| ආ.සං. ii කාණ්ඩය පළමු වන උ/ලේ (10) - | රාජ්‍ය සේවය අපකීර්තියට පත්වන අයුරින් කටයුතු කිරීම. |
| ආ.සං. ii කාණ්ඩය පළමු වන උ/ලේ (14) - | ජ්‍යෙෂ්ඨ නිලධරයකුගේ නීත්‍යානුකූල නියෝග ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ අකීකරුවීම හෝ පැහැර හැරීම. |
| ආ.සං. ii කාණ්ඩය පළමු වන උ/ලේ (15) - | ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, දෙපාර්තමේන්තු චක්‍රලේඛ, දෙපාර්තමේන්තු අත්පොත්වල සහ උපදෙස් සංග්‍රහවල විධිවිධාන |

ද උල්ලංඝනය කිරීම හෝ හිතාමතා හෝ අනවධානයෙන් හෝ නොසලකා හැරීම හෝ මගහැරී යන ආකාරයෙන් කටයුතු කිරීම.

ආ.සං. ii කාණ්ඩය පළමු වන උ/ලේ (16) - ඉහත දක්වා ඇති වැරදි සිදුකිරීමට අනුබලදීම හෝ සහය වීම හෝ ඒවා කිරීම සඳහා ඉඩකඩ සලසා දීම.

පැමිණිලිකාරියට එරෙහිව අංක 44385 යටතේ අනුරාධපුර ම/අධිකරණයේ නිල නිවසක් සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් විභාග වී ඇති අතර, එහිදී මෙම පැමිණිලිකාරිය නෙරපීමේ රිට් ආඥාවක් නිකුත් කර ඇත. එමෙන්ම මෙම කරුණ සම්බන්ධයෙන් අංක 33/2006 යටතේ උතුරුමැද පළාත් බද මහාධිකරණයේ නියෝගයක්ද ලැබී ඇති අතර, එහිදී පැමිණිලිකාරියව අදාළ නිල නිවසින් නෙරපීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණය විසින් ලබා දී ඇති නියෝගය ස්ථිර කර ඇති බවද නිරීක්ෂණය වේ.

ඉහත නඩු තීන්දුවල සඳහන් කරුණු සලකා බැලීමේදී පැමිණිලිකාරිය වරදක් සිදු කර ඇති අයෙකු බව කරුණු සඳහන් නොවන අතර, අදාළ නිල නිවසින් ඉවත් කිරීමේ නියෝගයක් පමණක් ලැබී ඇති බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, පැමිණිලිකාරිය ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ රාජ්‍ය නිලධාරීන් විසින් සිදු කළ හැකි වරදවල් සම්බන්ධව පළමුවන උපලේඛනය යටතට ගැනෙන 8,9,10,14,15,16 යන වගන්ති වල සඳහන් වැරදි සිදු කර ඇති බවයි.

ආයතන සංග්‍රහයේ 8,9,10,14,15,16 යන වගන්ති පරීක්ෂා කිරීමේ දී, පැමිණිලිකාරිය නිල නිවසක පදිංචි වී සිටීම හේතු කොට ගෙන පැමිණිලිකාරියට එරෙහිව දෙපාර්තමේන්තුව විසින් විධිමත් විනය පරීක්ෂණයක් සිදු කර නොමැති අතර, විධිමත් විනය පරීක්ෂණයක් සිදු නොකර ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ සඳහන් මෙකී වරදවල් පැමිණිලිකාරිය විසින් සිදු කර ඇති බවට වගඋත්තරකරු විසින් කරන ප්‍රකාශය නීතියට පටහැනිව සිදු කරන ලද ප්‍රකාශයක් බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරිය උසස්වීම සඳහා සුදුසුකම් ලබන 2017.12.31 දිනට පූර්වාසන්න වසර 05 ක කාලය තුළ පැමිණිලිකාරිය සතුටුදායක සේවා කාලයක් නොතිබීම යන්නට වගඋත්තරකරුවන් පෙන්වා දෙන්නේ පැමිණිලිකාරිය සම්බන්ධයෙන් අංක 44385 යටතේ අධිකරණයේ විභාග වූ නඩුව අනුව පැමිණිලිකාරිය අදාළ නිල නිවසින් නෙරපීමේ නියෝගයක් නිකුත් කිරීම වේ. නිල නිවසින් ඉවත් නොවීම රජයේ දේපළ අවභාවිතා කිරීමක් වන නමුදු, එමගින් පැමිණිලිකාරිය හට පිරිසිදු සේවා කාලයක් නොමැති බවට දැක්වීම නිවැරදි නොවේ.

එසේම පැමිණිලිකාරිය විසින් අවභාවිතා කරන ලදැයි පැවසෙන රාජ්‍ය දේපළ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් දේපළක් නොවන බවත්, එය පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවට අයත්ව තිබූ දේපළක් වන බවත් නිරීක්ෂණය වේ. පැමිණිලිකාරියගේ සේවා කාලය තුළ සතුටුදායක සේවා කාලය නිර්ණය කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත පැමිණිලිකාරියගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා වන පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක විසින් 2022.01.17 වන දින ලිපියක් යොමු කර ඇති අතර, එමගින් පැමිණිලිකාරිය සම්බන්ධයෙන් කිසිඳු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව දන්වා ඇත.

ඒ අනුව, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මෙම දේපළ අවභාවිතා කිරීම සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් කොට නොමැති තත්වයක් තුළදී, පැමිණිලිකාරිය සෞඛ්‍ය අමාත්‍යාංශයේ සේවයේ යෙදී සිටි කාලය තුළ සතුටුදායක සේවා කාලය නිර්ණය කිරීම සඳහා පැමිණිලිකාරිය විසින් වෙනත් දෙපාර්තමේන්තුවකට අයත් දේපළක් අවභාවිතා කළේය යන කරුණ අදාළ කර ගැනීම පිළිගත නොහැක.

ඒ අනුව, පැමිණිලිකාරියගේ 2017.12.31 දින සිට පූර්වාසන්න වසර 05 ක කාලය තුළ පැමිණිලිකාරිය සම්බන්ධයෙන් කිසිඳු විනය කටයුත්තක් සිදුව නොමැති බව නිරීක්ෂණය වන අතර, පැමිණිලිකාරියගේ මෙකී සේවා කාලය තුළ සතුටුදායක සේවා කාලයක් වාර්තා වී තිබියදී, පැමිණිලිකාරියට හිමි වීමට නියමිතව තිබූ උසස් වීමක් ලබා නොදීමට වගඋත්තරකරුවන් කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

දෙපාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති සියළුම කරුණු සළකා බැලීමේ දී වගඋත්තරකරුවන් පවසන ආකාරයට ආයතන සංග්‍රහයේ වරදක් පැමිණිලිකාරිය විසින් සිදු කර නොමැති බවටත්, පැමිණිලිකාරිය සම්බන්ධයෙන් අධිකරණයේ පැවැති නඩුවෙන් පැමිණිලිකාරිය වරදකරු කර නොමැති බවත්, පැමිණිලිකාරියට අධිකරණය මඟින් දඩයක් හෝ දඬුවමක් නියම කර නොමැති බවටත්, කරුණු නිරීක්ෂණය වන අතර, පැමිණිලිකාරියට හිමි උසස්වීම අධිකරණයේ නඩුවක් පැවතීම හේතු කොට ගෙන ලබා නොදීමට වගඋත්තරකරු විසින් ගෙන ඇති තීරණය තුළින් පැමිණිලිකාරියගේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාවෙහි සඳහන් අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.**

පැමිණිලිකාරිය හට අදාළ උසස්වීම් ලබා දීමට නියමිතව තිබූ දින සිට ක්‍රියාත්මක වන පරිදි 'කළමණාකාර සහකාර අධිශ්‍රේණියට' උසස්වීම ලබා දීමට කටයුතු කළ යුතුය.

2024.02. 28 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

01. ලේකම්, සභාපති
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - උතුරුමැද පළාත,
මෛත්‍රීපාල සේනානායක මාවත,
අනුරාධපුරය.

02. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,
උතුරුමැද පළාත.

03. මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය,
අනුරාධපුර.

B/